# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 502 — 1988 අප්‍රේල් 15 වැනි සිකුරාදා — 1988.04.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් ශාඛාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන | 265 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය ... | 262 | මිළ පාලන දැන්වීම් | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | 263 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකා ආණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන පත්කිරීම් ආදිය | — | ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තා | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | 263 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 269 |
| ලේජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය .. | — | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් | — |


සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම අග පිටුවේ, සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන භාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකටම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු, ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව—එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට වෙන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගි වීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනයට සති දෙකකට පෙර—එනම් 1988 අප්‍රේල් 22 වන දින පළ කෙරෙන ගැසට් පත්‍රයට ගැළපෙන දැන්වීම් 1988 අප්‍රේල් 08 දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1987 දෙසැම්බර් මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

261—B 75104—5,289 (88/04)
A1

එල්.ඩී.—බී 24/51

## මෝටර් රථ වාහන පනත

1981 අංක 21 දරන පනත මගින් සංශෝධිත (203 වන අධිකාරයා වූ මෝටර් රථ වාහන පනතේ IIවන කොටස සමඟ කියවිය යුතු ඒ පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

ඇම්. එච්. මොහොමඩ්,
ප්‍රවාහන අමාත්‍ය.

1988 මාර්තු මස 28 දින,
කොළඹදී ය.

## නියෝග

මෝටර් වාහන පනත යටතේ සාදන ලදුව, 1952 පෙබරවාරි මස 27 වන දින අංක 10360 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1951 මෝටර් වාහන (විවිධ) නියෝගවල 8 වන නියෝගයේ සිට 21 වන නියෝගය දක්වා වූ නියෝග වෙනුවට පහත දැක්වෙන නියෝග ආදේශ කිරීමෙන් එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### "හඳුනා ගැනීමේ තහඩු"

08. ගාස්තුවකට හෝ ත්‍යාගයකට පුද්ගලයන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන කිසියම් මෝටර් වාහනයකට සවිකොට ඇති එක් එක් හඳුනා ගැනීමේ තහඩුවක පසුබිම සුදු පැහැයෙන් යුක්ත විය යුතු අතර එම තහඩුවේ දැක්වෙන හැඳින්වීමේ අංකය රතු පැහැයෙන් තිබිය යුතුය.

09. වෙළෙඳ බලපත්‍රයක බලය පිට පාවිච්චි කරනු ලබන කිසියම් මෝටර් වාහනයක සවි කොට ඇති එක් එක් හඳුනාගැනීමේ තහඩුවක පසුබිම රතු පැහැයෙන් යුක්ත විය යුතු අතර එම තහඩුවේ දැක්වෙන බලපත්‍ර අංකය සුදු පැහැයෙන් තිබිය යුතුය.

10. මෙහි 8 වන නියෝගයෙහි හෝ 9 වන නියෝගයෙහි හෝ සඳහන් කොට ඇති මෝටර් වාහනයක් නොවන වෙනත් කිසියම් මෝටර් වාහනයක ඉදිරිපස සවි කොට ඇති එක් එක් හඳුනා ගැනීමේ තහඩුවක පසුබිම කලු පැහැයෙන් යුක්ත විය යුතු අතර, එම තහඩුවේ දැක්වෙන හැඳින්වීමේ අංකය සුදු පැහැයෙන් තිබිය යුතුය.

11. මෙහි 8 වන නියෝගයෙහි හෝ 9 වන නියෝගයෙහි හෝ සඳහන් කොට ඇති මෝටර් වාහනයක් නොවන වෙනත් කිසියම් මෝටර් වාහනයක පිටුපස සවි කොට ඇති එක් එක් හඳුනාගැනීමේ තහඩුවක පසුබිම කහ පැහැයෙන් (ආලෝකය පරාවර්තනය වන හෝ සංදීප්තවන) යුක්ත විය යුතු අතර, එම තහඩුවේ දැක්වෙන හැඳින්වීමේ අංකය කලු පැහැයෙන් තිබිය යුතු ය.

12. එක් එක් හඳුනා ගැනීමේ තහඩුවෙහි දැක්වෙන අකුරු සහ ඉලක්කම් ඒකාකාර ප්‍රමාණයෙන් තිබිය යුතුය.

13. මෝටර් සයිකලයක් හෝ ආතුර රථයක් හෝ නොවන වෙනත් යම් මෝටර් වාහනයකට සවිකොට ඇති සෑම තහඩුවකම ඇති එක් එක් අකුරක් සහ ඉලක්කමක්, උසින් අඟල් 3½ කට අඩු නොවිය යුතුය ; සෑම අකුරක සහ ඉලක්කමක සෑම කොටසක්ම අවම වශයෙන් අඟල් 5/8 ක් පළල් විය යුතුය. "1" ඉලක්කම හැර අනිත් සෑම අකුරක් සහ ඉලක්කමක් සඳහා ගන්නා ඉඩ ප්‍රමාණයේ මුළු පළල ප්‍රමාණය, අවම වශයෙන් අඟල් 2½ ක්වත් විය යුතු ය.

14. මෝටර් සයිකලයක් හෝ ආතුර රථයක් හෝ නොවන වෙනත් යම් මෝටර් වාහනයකට සවි කොට ඇති තහඩුවක ඇති යාබද අකුරු සහ යාබද ඉලක්කම් අතර ඉඩ ප්‍රමාණය පළලින් අඟල් 1/2 ක් විය යුතුය හඳුනාගැනීමේ තහඩුවක මුදුන සහ පතුලත් යම් අකුරක, හෝ ඉලක්කමක ආසන්නම කොටසක් අතර අවම වශයෙන් අඟල් 1/2 ක වත් අයිනක් තිබිය යුතු අතර තහඩුවේ එක් එක් පැත්තක් හා අකුරක හෝ ඉලක්කමක ආසන්නම කොටසක් අතර අවම වශයෙන් අඟල් 1 ක වත් අයිනක් තිබිය යුතුය. තහඩුවේ ඇති ඉලක්කම් සහ අකුරු පේළි දෙකකින් සමන්විත වේ නම් එක් එක් පේළිය අතර ඉඩ ප්‍රමාණය අඟල් 3/4 කට අඩු නොවිය යුතුය.

15. මෝටර් සයිකලයක හෝ ආතුර රථයක හෝ සවි කොට ඇති සෑම හඳුනා ගැනීමේ තහඩුවක ම ඇති එක් එක් අකුරක් සහ ඉලක්කමක් උසින් අඟල් 2 1/2 ට අඩු නොවිය යුතු අතර, "1" ඉලක්කම හැර අනික් සෑම අකුරක් සහ ඉලක්කමක් ම පළලින් අඟල් 1 4/5 කට අඩු නොවිය යුතුය සෑම අකුරක සහ ඉලක්කමක සෑම කොටසක්ම අවම වශයෙන අඟල් 2/5 ක් පළල් විය යුතු ය.

16. මෝටර් සයිකලයක හෝ ආතුර රථයක හෝ සවි කොට ඇති හඳුනා ගැනීමේ තහඩුවක ඇති යාබද අකුරු සහ යාබද ඉලක්කම් අතර, ඉඩ ප්‍රමාණය පළලින් අඟල් 2/5 ක් විය යුතු ය. හඳුනා ගැනීමේ තහඩුවක මුදුන සහ පතුලත් යම් අකුරක හෝ ඉලක්කමක ආසන්නතම කොටසත් අතර ද තහඩුවේ එක් එක් පැත්තක් හා අකුරක හෝ ඉලක්කමක ආසන්නතම කොටසක් අතර ද අවම වශයෙන් අඟල් 1/2 ක වත් අයිනක් තිබිය යුතු ය. තහඩුවේ ඇති ඉලක්කම සහ අකුරු පේළි දෙකකින් සමන්විත වේ නම්, එම එක් එක් පේළි අතර ඉඩ ප්‍රමාණය අඟල් 3/5 කට අඩු නොවිය යුතුය.

17. සියළුම මෝටර් වාහනවලට සවි කොට ඇති සෑම තහඩුවක ම අකුරු සහ ඉලක්කම් අතුර ඉඩ ප්‍රමාණය අඟල් 1 1/2 කට අඩු නොවිය යුතු ය.

18. ට්‍රේලරයක් නොවන වෙනත් යම් මෝටර් වාහනයක—

(අ) එම වාහනයේ ඉදිරිපිට කුමන ස්ථානයක සිට බැලුවත්, තහඩුවෙහි ඇති හැඳින්වීමේ අංකය පැහැදිලිව දැක ගත හැකි වන ආකාරයට, වාහනය ඉදිරිපසින් හැඳින්වීමේ තහඩුවක් සවි කර තිබිය යුතු ය; තවද

(ආ) රාත්‍රි කාලයේ දී ආලෝකමත් කර තිබිය යුතු තහඩුවක් පිටුපසින් සවි කර තිබිය යුතු අතර, වාහනයේ පිටුපස සිට බැලූවිට හැඳින්වීමේ අංකය, පැහැදිලිව දැක ගත හැකි වන ආකාරයට එම තහඩුව සවි කොට තිබිය යුතු ය.

එසේ වුවද, හැඳින්වීමේ අංකය දෙපැත්තේම දැක්වෙන තහඩුවක් මෝටර් සයිකලයේ ඉදිරිපසින් හෝ රෝදය හා එකම තලයක සිටින සේ ඉදිරිපස මඩ වරණයේ හෝ සවි කර තිබිය යුතුය. මෝටර් සයිකලයේ වම් පැත්තේ සිට හෝ දකුණු පැත්තේ සිට හෝ, එහි හැඳින්වීමේ අංකය පැහැදිලිව දැක ගතහැකි වන ආකාරයට එම තහඩුව සවිකොට තිබිය යුතුය.

19. සෑම ට්‍රේලරයකම පිටුපසින්, එකකට ඉහළින් එකක් සිටින සේ තහඩු දෙකක් සවි කොට තිබිය යුතු අතර, ඒවා රාත්‍රි කාලයේදී ආලෝකමත් කොට තිබිය යුතුය. ට්‍රේලරයේ පිටුපස සිට බැලූ විට තහඩුවල ඇති හැඳින්වීමේ අංක පැහැදිලිව දැකගත හැකි වන ආකාරයට එම තහඩු සවි කොට තිබිය යුතුය.

ට්‍රේලරය අමුණා ඇති මෝටර් වාහනයේ හැඳින්වීමේ අංකය ඉහළ තහඩුවේ සඳහන් විය යුතු අතර, ට්‍රේලරයේ හැඳින්වීමේ අංකය පහළ සඳහන් විය යුතුය.

20. මෙම නියෝගවල කාර්යයන් සඳහා, හඳුනා ගැනීමේ තහඩුවක ඇති අකුරු සහ ඉලක්කම්, සාමාන්‍ය ඇස් පෙනීම ඇති තැනැත්තකු හට,


(අ) දිවා කාලයේ දී යාර 50 ක දුර ප්‍රමාණයක සිට ද,

(ආ) රාත්‍රි කාලයේදී යාර 20 ක දුර ප්‍රමාණයක සිට ද,


පහසුවෙන් කියවිය හැකි නම්, එම හඳුනාගැනීමේ තහඩුව පැහැදිලිව බලාගත හැකි ලෙස සැලකිය යුතුය.

21. පනතේ අංක 21 දරණ වගන්තිය මගින් නියම කෙරෙන මෝටර් වාහනවල හැඳින්වීමේ තහඩු මෙහි පහත දක්වා ඇති යම් රූප සටහනකට අනුව පිළියෙල කොට තිබිය යුතුය.


අංක 1 සටහන




අංක 2 සටහන




අංක 3 සටහන




21. අ. මෙම නියෝගවල කාර්යයන් සඳහා මෙහි පහත IIවන තීරයෙහි නියම කොට ඇති මිනුම් ප්‍රමාණයන්, ඊට අනුරූපව මෙහි පහත I වන තීරයෙහි නියම කොට ඇති මිනුම් ප්‍රමාණයන්ට සමානුරූපි විය යුතුය.

| I තීරුව | II තීරුව |
|---|---|
| යාර 50 | මීටර් 50 |
| යාර 20 | මීටර් 20 |
| අඟල් 3 1/2 | මිලිමීටර් 100 |
| අඟල් 2 1/2 | මිලි මීටර් 75 |
| අඟල් 1 3/4 | මිලිමීටර් 40 |
| අඟල් 1 4/5 | මිලි මීටර් 50 |
| අඟල් 1 1/2 | මිලි මීටර් 40 |
| අඟල් 1 | මිලි මීටර් 25 |
| අඟල් 3/4 | මිලි මීටර් 20 |
| අඟල් 1/2 | මිලි මීටර් 15 |
| අඟල් 2/5 | මිලි මීටර් 10 |

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 893/4 — 1995 ඔක්තෝබර් 17 වැනි අඟහරුවාදා — 1995.10.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්ඩී/බී24/51v

**මෝටර් වාහන පනත**

1981 අංක 21 දරන පනතින් සංශෝධිත (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ II වන කොටස සමග කියවිය යුතු, ඒ පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන, පාරිසරික හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යවරිය විසින් සාදන ලද නියෝගය.

ශ්‍රීමනී ඇතුලත්මුදලි,
ප්‍රවාහන, පරිසර හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 මාර්තු මස 12 වන දින,
කොළඹ දී ය.

**නියෝගය**

1988 අප්‍රේල් මස 15 වන දින අංක 502 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මගින් අවසන් වරට සංශෝධිත, 1952 පෙබරවාරි මස 27 වන දින අංක 10360 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1951 මෝටර් වාහන (විවිධ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(i) එහි 13 වන නියෝගයෙහි 'උසින් අඟල් 3 1/2කට' යන වචන හා ඉලක්කම් වෙනුවට 'උසින් අඟල් 03 කට' යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්, සහ,

(ii) එහි 21අ නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය ඇතුළත් කිරීමෙන් :–
'21ආ(අ) මෝටර් වාහන පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යටතේ යම් මෝටර් වාහනයක සළකුණු කිරීමට නියම කරනු ලැබූ ඉලක්කම් හෝ අකුරු හෝ මෝටර් වාහනයක නිෂ්පාදකයා විසින් ඒ වාහනයෙහි සළකුණු කරනු ලැබූ විස්තරාත්මක තොරතුරු නොවන ඉලක්කම් හෝ අකුරු ඒ මෝටර් වාහනයේ ඉදිරිපස හෝ පිටිපස සළකුණු කරනු නොලැබිය යුතු ය.

(ආ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් ලිඛිතව දෙනු ලැබූ පූර්ව අවසරය ඇතිව හැර, මෝටර් වාහන පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යටතේ සළකුණු කිරීමට නියම කරනු ලැබූ ඉලක්කම් හෝ අකුරු නොවන ඉලක්කම් හෝ අකුරු කිසිවක් යම් මෝටර් වාහනයක පැතිවල සළකුණු කරනු නොලැබිය යුතුය."

11–56


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A—D 037924–2,785 (95/10)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1132 / 18 – 2000 මැයි 19 වැනි සිකුරාදා – 2000.05.19

1132 / 18 ஆம் இலக்கம் - 2000 ஆம் ஆண்டு மே மாதம் 19 ஆம் திகதி வெள்ளிக்கிழமை

No. 1132 / 18 – FRIDAY, MAY 19, 2000

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

#### මෝටර් වාහන පනත

1981 අංක 21 දරන පනතින් සංශෝධිත (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් කරන ලද නියෝග.

ඒ. එච්. එම්. ෆවුසි
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2000 මැයි මස 16 වන දින,
කොළඹ දී ය.

නියෝග

1988 අප්‍රේල් මස 15 දින අංක 502 දරන ගැසට් පත්‍රය මගින් සහ 1995 ඔක්තෝබර් මස 17 දින අංක 893/4 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරනු ලැබූ 1952 පෙබරවාරි මස 27 වන දින අංක 10360 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1951 මෝටර් වාහන (විවිධ) නියෝග මෙහි පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(අ) එහි හඳුනාගැනීමේ තහඩු යන ශීර්ෂය වෙනුවට වාහන ලියාපදිංචි කිරීම – මෝටර් වාහන සඳහා හඳුනා ගැනීමේ අංක තහඩු යන ශීර්ෂය ආදේශ කිරීමෙන් ;

(ආ) එහි 8 සිට 21 ආ නියෝග වෙනුවට පහත දැක්වෙන නියෝග ආදේශ කිරීමෙන් :–

8. (අ) මෝටර් වාහන පනතේ 21 වන වගන්තියේ කාර්ය සඳහා (මෙහි මින් මතු මේ නියෝගවල හඳුනාගැනීමේ අංක තහඩු යනුවෙන් සඳහන් කරනු ලබන) වාහන ලියාපදිංචි කිරීම හඳුනා ගැනීමේ අංක තහඩු මේ නියෝගවල පළමුවන උපලේඛනයේ දක්වා ඇති රූප සටහන්වලට සහ දිග පළල ප්‍රමාණයන්ට අනුකූල වන්නේ නම් මිස, භාවිත කරනු නොලැබිය යුතු ය.

(ආ) මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ ගාස්තු ගෙවීමේ දී හඳුනා ගැනීමේ අංක තහඩු නිකුත් කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ නියෝගවල II වන උපලේඛනයේ දක්වා ඇති විස්තර සහ දිග පළල ප්‍රමාණයන් මේ නියෝගවල 1 වන උපලේඛනයේ දක්වා ඇති රූප සටහන්වලට අනුකූල විය යුතු ය.

9. හඳුනා ගැනීමේ අංක තහඩුවේ සෑම අකුරක්, ඉලක්කමක් හෝ අංකයක් සිරස්ව සිටින සේ සහ පහසුවෙන් හඳුනාගත හැකි පරිදි, මෝටර් වාහනයේ ඉදිරිපස හරි මැද (ප්‍රධාන ලාම්පුවලට පහළින්) සහ, මෝටර් වාහනයේ පිටුපස හරිමැද හෝ සමීප අංශයේ සිරස්ව සිටින සේ ප්‍රදර්ශනය කළ යුතුය.

0 10. (අ) යාන්ත්‍රිකව පදවනු ලබන මෝටර් වාහනයකට ඉදිරිපසින් හෝ පිටුපසින් හෝ තවර වුවද වර්ගයක වාහන එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ අමුණා ඇති අවස්ථාවක දී එකී යාන්ත්‍රිකව පදවනු ලබන වාහනයේ ඉදිරිපස හෝ පිටුපස හෝ ප්‍රදර්ශනය කිරීමට නියමිත හඳුනාගැනීමේ අංක තහඩුව, එසේ අමුණා ඇති වාහනවලින් ඉදිරිපසින්ම ඇති වාහනයේ හෝ පිටුපසින්ම ඇති වාහනයේ හෝ, අවස්ථාවෝචිත පරිදි, ඉදිරි පසින් හෝ පිටුපසින් හෝ, යට කී පදවන හෝ ප්‍රචාලනය කරන හෝ වාහනයේ හඳුනාගැනීමේ අංක තහඩු සවිකිරීමට නියම කොට ඇති ආකාරයෙන්ම ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(ආ) (I) සෑම ට්‍රේලරයකම පිටුපසින්, එකකට ඉහළින් එකක් සිටින සේ තහඩු දෙකක් සවිකොට තිබිය යුතු අතර, ඒවා රාත්‍රි කාලයේදී ආලෝකමත් කොට තිබිය යුතු ය. ට්‍රේලරයේ පිටුපස සිට බැලූ විට තහඩුවල ඇති හැඳින්වීමේ අංක පැහැදිලිව දැකගත හැකිවන ආකාරයට එම තහඩු සවි කොට තිබිය යුතු ය.

(II) ට්‍රේලරයේ අමුණා ඇති මෝටර් වාහනයේ හඳුනාගැනීමේ අංක තහඩුව ඉහළ තහඩුවේ තිබිය යුතු අතර, ට්‍රේලරයේ හඳුනාගැනීමේ අංක තහඩුව පහළ තහඩුවේ තිබිය යුතු ය.

11. (අ) හිරු බැසීමෙන් පැය 1/4 පසුව සහ හිරු පැය 1/4 පෙර වූ කාලයෙහි අතරතුර මෝටර් වාහනයක් මාර්ගයක තිබෙන විට මෝටර් වාහනයේ පිටු පස ප්‍රදර්ශනය වන අංක තහඩුව හෝ මෝටර් වාහනය මගින් ඇදගෙන යනු ලබන පිටුපසම වූ වාහනයේ පිටුපස අංක තහඩුව, අංක තහඩුවේ සෑම අකුරක්, ඉලක්කමක් සහ අංකයක්ම පහසුවෙන් හඳුනාගත හැකිවෙන පරිදි ප්‍රමාණවත් ලෙස ආලෝකමත් කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ විධිවිධාන, ප්‍රමාණවත් ලෙස ආලෝකය ඇති පාරක නවතා තබා ඇති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

12 (අ) මේ නියෝගවල III වැනි උපලේඛනයේ වඩා හොඳින් විස්තර කර ඇති (මෙහි මින්මතු මේ නියෝගවල "ස්ටිකරය" යනුවෙන් සඳහන් කරනු ලබන) වාහන ලියාපදිංචි කිරීම් හඳුනා ගැනීමේ අංක තහඩු ස්ටිකරය –

1 වන ඡේදයේ සඳහන් හඳුනා ගැනීමේ අංක තහඩුවලට අතිරේකව මේ නියෝගවල හතර උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමේ දී සියලු වාහනවලට නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) වාහන ලියාපදිංචි කිරීමේ අංකය සහිත ස්ටිකරය ඉදිරිපස වින්ඩ්ස්ක්‍රීන් වීදුරුවේ ඇතුළත උඩ වම් කෙළවරේ ආදායම් බලපත්‍රයට ඉහළින් ප්‍රකටව පෙනෙන ස්ථානයක අලවනු ලැබිය යුතු ය.

(ඇ) ස්ටිකරයේ අංගෝපාංග කල් පවතින ආරක්ෂිත මැලියම් ආලේපිතව තිබිය යුතු අතර, එය මිලිමීටර් 86×54 ප්‍රමාණයෙන්, සෘජු කෝණාස්‍ර හැඩයෙන් යුක්ත විය යුතු ය.

(ඈ) ස්ටිකරයේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ලාංඡනයද, වාහනයේ ලියාපදිංචි අංකය, අකුරු සහ ඉලක්කම් ද ඇතුළත් විය යුතු ය ;

(ඉ) ස්ටිකරය වින්ඩ්ස්ක්‍රීන් වීදුරුවේ ඇලවිය හැකි වනු පරිදි ස්ටිකරයේ පිටුපස, ගලවා ඉවත් කළහැකි දීප්තියක් නොමැති සුදු පාට වයිනයිල් තට්ටුවකින් ලැමිනේට් ක්‍රමයට සකස් කොට තිබිය යුතු ය.

(ඊ) ස්ටිකරය තුළ වූ මෝස්තර රාමුව, විචලාෘතාප ක්‍රමයට මුද්‍රණය කළ නම අත් අකුරෙන් ලියා සකස් කළ, මෝස්තරයක් විය යුතුය.

13 (අ) මේ නියෝගවල හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමේ දී මෝටර් රථ කොමසාරිස්වරයා විසින්, ලියාපදිංචි කරන ලද සියලුම වාහන නැවත ලියාපදිංචි කොට අලුත් ලියාපදිංචි අංකයක් ද ලබා දී ආරක්ෂිත අංග සහිත අංක තහඩු දෙකක්ද සිටිකරයක් ද, වාහන හඳුනාගැනීමේ කාඩ් පතක් ද නිකුත් කළ යුතු ය;

(ආ) සියලු වාහන නැවත ලියාපදිංචි කිරීම කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි අදියරවලින් කළ යුතු ය;

14. (අ) මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරුවකු විසින්, එකී වාහනයේ හඳුනාගැනීමේ අංක තහඩුව, මේ නියෝග වලට අනුකූලව අයිතිකරු වශයෙන් ඒ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලබන්නේ මේ නියෝග යටතේ කලින් ලියාපදිංචි කර නොමැති යම් වාහනයක් සම්බන්ධයෙන් ද ඒ වාහනයට වෙන්කර ගැනීම පිණිස මෝටර් වාහන කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක, වාහන ලියාපදිංචි කිරීමේ විශේෂ හඳුනා ගැනීමේ අංක තහඩුවක් ලබා ගැනීම සඳහා මෝටර් වාහන කොමසාරිස්වරයා හට ඉල්ලුම් කරනු ලැබිය හැකිය.

(ආ) පළමුවෙන් සඳහන් කරන ලද වාහන සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ හෝ ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීමේ පොත හෝ ලියාපදිංචි කිරීමේ සහතිකය සහ බලපත්‍රය භාරදීමෙන් පසු සහ මේ නියෝගවල හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමේ දී ඒ හඳුනාගැනීමේ අංක තහඩු නිකුත් කරනු ලැබිය හැකි ය.

15. (අ) ධාවනයේ පවතින මෝටර් වාහනයක හඳුනාගැනීමේ අංක තහඩු, කියවීමට හෝ හඳුනාගැනීමට අපහසුවන පරිදි වෙනත් අකුරු, ඉලක්කම් හෝ අංක නැතහොත් මෝස්තරයක්, වෙළඳ දැන්වීමක් හෝ සැරසිල්ලක් හඳුනා ගැනීමේ අංක තහඩු අසල නොතැබිය යුත්තේ ය.

(ආ) මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ ප්‍රදර්ශනය කිරීමට නියමිත අකුරු, ඉලක්කම් හෝ අංක හෝ මෝටර් වාහනයේ නිෂ්පාදකයා විසින් එහි ලකුණු කර විස්තරාත්මක තොරතුරු හෝ හැර වෙනත් කිසිම අකුරු, ඉලක්කම් හෝ අංක එම මෝටර් වාහනයේ ඉදිරිපස හෝ පිටුපස ලකුණු කරනු නොලැබිය යුතු ය.

(ඇ) මේ නියෝග යටතේ, හඳුනාගැනීමේ අංක තහඩුවල කිසිම කොටසක් කිසිම ආකාරයකට ඉවත් කිරීම, එය මත මුද්‍රාවක් තැබීම, දුර්වර්ණ කිරීම, මැකීම හෝ හානිකිරීම සිදු නොකළ යුතු ය.

16. 17 වගන්තිය සඳහන් මෝටර් වාහනයක් හැර වෙනත් මෝටර් වාහන සඳහා ඉදිරිපස ලියාපදිංචිකිරීමේ අංක තහඩුවේ අකුරු, ඉලක්කම් සහ අංක සුදු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක තිබිය යුතු අතර වාහනයේ පිටුපස අංක තහඩුවේ පසුබිම කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමකින් යුක්ත විය යුතුය. තවද ඉදිරිපස සහ පිටුපස අංක තහඩුවල අකුරු, ඉලක්කම්, අංක කළු පැහැයෙන් රජනය සහිතව මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන් සකස් කළ යුතු ය.

17. වෙළඳ බලපත්‍ර තහඩුව සඳහා වූ අධිකාරය යටතේ භාවිත කරනු ලබන මෝටර් වාහන සඳහා ඉදිරිපස සහ පිටුපස හඳුනාගැනීමේ අංක තහඩුවල අංක, ඉලක්කම් සහ අංක රතු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක සෘජු කෝණාස්‍රාකාර තහඩුවක් මත සුදු පැහැයෙන් රජනය සහිතව මුද්‍රා තැබීමෙන් හෝ තෙරපීමෙන් සකස් කළ යුතු ය.

18. (අ) හඳුනාගැනීමේ අංක තහඩුව ප්‍රතිපරාවර්තන තහඩුවක් විය යුතු ය. තහඩුව මත අකුරු, ඉලක්කම් සහ අංක නොමැකෙන සේ සටහන් කළ යුතු අතර, තහඩුව වාත්තු කළ හෝ තෙරපන ලද ලෝහමය අකුරු නෙරා සිටින සේ එම්බෝස් කර පහසුවෙන් නොගැලවෙන සේ සකස් කළ යුතු ය,

(ආ) හඳුනාගැනීමේ අංක තහඩුවල –

(i) ප්‍රතිපරාවර්තන උසස් තත්ත්වයේ ඇලුමිනියම් තහඩු මත ඉහළ වම්පස කෙළවරේ ඇතුළට ගිලී සිටින සේ ආරක්ෂිත අංගද ඇතුළත් කොට තිමවූ, ශ්‍රී ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ලාංඡනය ඇතුළත් විය යුතු ය.

(ii) පහත වම් කෙළවරේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ලාංඡනයට යටින් ප්‍රාදේශීය හඳුනා ගැනීමේ අකුරු දෙක එම්බෝස් කළ යුතුය.

(iii) අකුරු දෙකක්, ඉරක් සහ ඉලක්කම් හතරක් ඇතුළත් විය යුතු ය ; සහ

(iv) ඉරට උඩින් හඳුනාගැනීමේ අංක තහඩුව මත ක්‍රෝමියන් යොදාගත් ආරක්ෂිත හොලෝ ග්‍රෑමය රජනය සහිතව මුද්‍රා තැබිය යුතු ය ;

(ඇ) සෑම හඳුනාගැනීමේ අංක තහඩුවකම අකුරු, ඉලක්කම් සහ අංක මේ නියෝගවල 2 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට විය යුතු අතර ඒවා සමාන ප්‍රමාණයන්ගෙන් යුක්ත විය යුතු ය.

19. මේ නියෝගවල කාර්ය සඳහා පවත්නා පළාත් නවය සඳහා හඳුනාගැනීමේ අකුරු පහත සඳහන් පරිදි විය යුතු ය :–

| | | | |
|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත | – | WP |
| 2. | දකුණු පළාත | – | SP |
| 3. | නැගෙනහිර පළාත | – | EP |
| 4. | උතුරු පළාත | – | NP |
| 5. | උතුරු මැද පළාත | – | NC |
| 6. | මධ්‍යම පළාත | – | CP |
| 7. | වයඹ පළාත | – | NW |
| 8. | සබරගමුව පළාත | – | SG |
| 9. | ඌව පළාත | – | UP |

20. මේ නියෝගවල කාර්ය සඳහා, සාමාන්‍ය දෘෂ්ටියක් ඇති පුද්ගලයෙකුට –

(අ) දිවා කාලය තුළ දී මීටර් විසිපහක දුර ප්‍රමාණයක සිට ; සහ


(ආ) රාත්‍රී කාලයේදී මීටර් විස්සක දුර ප්‍රමාණයක සිට අංක තහඩුවල අකුරු, ඉලක්කම් සහ අංක පැහැදිලිව කියවිය හැකි නම් එම අංක තහඩුව පැහැදිලිව හඳුනාගත හැකි ලෙස සළකනු ලැබේ.


21. "ලියාපදිංචි අංක තහඩු, ස්ටිකර් සහ විශේෂ වාහන ලියාපදිංචි කිරීම් හඳුනාගැනීමේ අංක තහඩු නිකුත් කිරීම සඳහා, ආපසු ලබාගැනීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම සඳහා එකම බලධරයා වනුයේ මෝටර් රථ කොමසාරිස්වරයායි."


I වන උපලේඛනය


සියලුම මෝටර් වාහනවල ඇති හඳුනාගැනීමට අංක තහඩු පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් සමන්විත විය යුතුය:


| වාහන වර්ගය | තහඩුවල ප්‍රමාණය | රූප සටහන |
|---|---|---|
| 1. ඉඩම් වාහන සහ මෝටර් සයිකල් හැර සියලුම වාහන | මි. මී. 520 x 110 | අංක : 1 |
| 2. එම | මි. මී. 280 x 200 | අංක : 2 |
| 3. එම | මි. මී. 280 x 180 | අංක : 3 |
| 4. ඉඩම් වාහන සහ මෝටර් සයිකල් | මි. මී. 240 x 130 | අංක : 4 |
| 5. මෝටර් සයිකල් | මි. මී. 300 x 80 | අංක : 5 |


AB-1234
CP
560


AB-
1234
CP


AB-
1234
CP


AB-
1234
CP


AB-1234
CP

II වන උපලේඛනය

| වාහන වර්ගය | ඉහළ තීරුව සහ – අතර ඉඩ ප්‍රමාණය (මි. මී. වලින්) | | | | පහළ තීරුව සහ – අතර ඉඩ ප්‍රමාණය (මි. මී. වලින්) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | රාජ්‍ය ලාංඡනය | අකුරු | ආරක්ෂිත සළකුණ | අංක | පළාත් අක්ෂරය | අකුරු | ඉරක් | අංක |
| 1. සියලු වාහන | 8 | 12 | 10 | 12 | 12 | 12 | 28 | 12 |
| 2. සියලු වාහන | 3 | 12 | 10 | – | 80 | – | – | 10 |
| 3. සියලු වාහන | 5 | 10 | 10 | – | 80 | – | – | 10 |
| 4. ඉඩම් වාහන සහ මෝටර් සයිකල් | 8 | 5 | 5 | – | 40 | – | 75 | 5 |
| 5. මෝටර් සයිකල් | 2 | 10 | 8 | 10 | 10 | 10 | 30 | 10 |

| වාහන වර්ගය | වම් තීරුව සහ – අතර ඉඩ ප්‍රමාණය (මි. මී. වලින්) | | | දකුණු තීරුව සහ – අතර ඉඩ ප්‍රමාණය (මි. මී. වලින්) | | | පේළි දෙක අතර ඉඩ ප්‍රමාණය මි. මී. වලින් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රාජ්‍ය ලාංඡනය | පළාත් අකුරු | අංක | ආරක්ෂිත සළකුණ | ඉරක් | අංක | පළාත් අකුරු හා අංක | අකුරු සහ අංක | ඉරක් සහ අංක |
| 1. සියලු වාහන | 25 | 8 | – | – | – | 20 | – | – | – |
| 2. සියලු වාහන | 25 | 8 | 40 | 30 | 20 | 40 | 18 | 25 | 53 |
| 3. සියලු වාහන | 25 | 8 | 25 | 20 | 10 | 25 | 12 | 12 | 40 |
| 4. ඉඩම් වාහන සහ මෝටර් සයිකල් | 25 | 10 | 80 | 20 | 18 | 35 | – | 10 | 22 |
| 5. මෝටර් සයිකල් | 20 | 5 | – | – | – | 5 | – | – | – |

රාජ්‍ය ලාංඡනය, අකුරු , ඉලක්කම් සහ අංක, ඉර සහ ආරක්ෂිත සළකුණ පහත සදහන් ප්‍රමාණවලින් යුක්ත විය යුතුය:

| වාහන වර්ගය | රාජ්‍ය ලාංඡනය මි. මී.ලින් | පළාත් හදුනා ගැනීමේ අකුරු මි. මී. වලින් | ආරක්ෂිත සළකුණේ විෂ්කම්භය මි. මී වලින් | ඉර මි මී. වලින් | අකුරුවල උස, පළල සහ ඝනකම මි. මී. වලින් | අංකවල උස, පළල සහ ඝනකම මි. මී. වලින් |
|---|---|---|---|---|---|---|
| 1. සියලු වාහන | 35x23 | 40x25x5 | 23 | 42x9 | 75x47.5x10 | 75x46x10 |
| 2. සියලු වාහන | 35x23 | 40x25x5 | 23 | 36x7 | 60x35x9 | 60x35.5x9 |
| 3. සියලු වාහන | 28x20 | 30x18x5 | 23 | 35x7 | 60x37.5x9 | 60x35.5x9 |
| 4. ඉඩම් වාහන සහ මෝටර් සයිකල් | 30x20 | 30x20x5 | 23 | 30x5 | 50x30x7 | 50x25x7 |
| 5. මෝටර් සයිකල් | 25x17 | 28x15x5 | 23 | 23x5 | 49x26.5x8 | 49x25x8 |

2 – H007449 (2000/05)

II වන උපලේඛනය - (සම්බන්ධිතයි)

| වාහන වර්ගය | පළාත් අකුරු අතර ඉඩ ප්‍රමාණය මි. මී. වලින් | අංක අතර ඉඩ ප්‍රමාණය මි. මී. වලින් | රාජ්‍ය ලාංඡනය සහ පළාත් හඳුනාගැනීමේ අකුරු අතර ඉඩ ප්‍රමාණය මි. මී. වලින් | ආරක්ෂිත සළකුණ අතර ඉඩ ප්‍රමාණය මි. මී. වලින් | ඉර සහ අංක අතර ඉඩ ප්‍රමාණය මි. මී. වලින් |
|---|---|---|---|---|---|
| 1. සියලු වාහන | 12 | 10 | 4 | 10 | 33 |
| 2. සියලු වාහන | 12 | 15 | 4 | 5 | 53 |
| 3. සියලු වාහන | 10 | 8 | 4 | 7 | 40 |
| 4. ඉඩම් වාහන සහ මෝටර් වාහන | 15 | 15 | 4 | 2 | 22 |
| 5. මෝටර් සයිකල් | 8 | 8 | 4 | 2 | 20 |

III වන උපලේඛනය

මි. මී. 86 x මි. මී. 54

IV වන උපලේඛනය

(i) හඳුනා ගැනීමේ අංක තහඩු සඳහා ගාස්තු ප්‍රමාණ :-

| ප්‍රමාණ | යුගලයක් සඳහා ගාස්තුව |
|---|---|
| 1. මි. මී. 520 x 110 | රු. 1,250 |
| 2. මි. මී. 280 x 180 | රු. 1,250 |
| 3. මි. මී. 280 x 200 | රු. 1,250 |
| 4. මි. මී. 240 x 130 | රු. 900 |
| 5. මි. මී. 300 x 80 | රු. 900 |

(ii) විශේෂ වාහන ලියාපදිංචි කිරීමේ හඳුනාගැනීමේ අංක තහඩු සඳහා වූ ගාස්තුව රු. 7,500.00 යි.

06 - 100